සංගීත රසිකයකු ලෙස මා ළඟ මිහිරි අත්දැකීමක නම් මීට වසරකට පමණ පෙර පැවති සිඩ්නි ඔපෙරා ගෘහයේ පැවති රෝහණ රන්සර ගීප්‍රසංගය සැරසීමය. එයට ඇතුළත වූ එක විශේෂාංගයක් අනතක නොවන අයුරින් මා සිත බැඳගිනි. එනම් මහදුරු සුනිල් ආරියරත්න කල කෙටි දෙසුමය. එම දෙසුමේදී ඔහු හෙළ ගී කෙত සරුකල, හිඳි කොපි වසංගතයෙන් හෙළ ගීතාවලිය රැකගත්, ගාන්ධර්වයින් අතලොස්සක නම් කලෙය. කලාශූරී ෂෙලටන් ප්‍රේමරත්නයන්ද ඉන් කෙනෙකි. මහදුරු සුනිල් ආරියරත්න ගේ ප්‍රධානත්වයෙන් මෙලබන් නුවර පැවති හෙළ කවිය සහ ගීතය පිළිබඳ වැඩමුලුවේදීද ෂෙලටන් ප්‍රේමරත්නයන් ඇගයීමට ලක් කෙරින. හෙළ ගීකත සරුකල සැබෑ ගාන්ධර්වයින් අතරින් අද ජීවතුන් අතර සිටින්නේ ෂෙලටන් ප්‍රේමරත්න ඇතුළු ටිකදෙනෙකු පමනි. ඔහු ගැන කොයා බැලීම රසික අපගේ යුතුකමකි.

පෙරයුගයේ සිටි අති දක්ෂ සංගීතඥයකුවන සාදිරිස් මාස්ටර් ෂෙලටන් ප්‍රේමරත්න ගේ පියාය. සිය දස්කම් උදෙසා පිටරටින් පවා නොයෙකුත් සම්මාන දිනූ සාදිරිස් මාස්ටර ගේ උපදෙසින් සහ ඔහුගේ පොතපත ඇසුරෙන් සිය සංගීත ඥානය දියුනු කරගත් ෂෙලටන්, පියාගේ අඩිපාරේ යන්නට පටන් ගත්තේය. තෝරාගත් මුළුම රැකියාව සංගීත ගුරු කම වුවත් ඔහ වැඩිකලක් නොගොසින්ම චිත්‍රපට සංගීත අධ්‍යක්ෂයයට පිවිසුනි.

නන්දා මාලනී ගේ සිනමා ගීතාවලිය සංයුක්ත තැටියෙහි ගී "යොතකා සැප ඇයි" යනුවෙන් ඇරඹෙන ගීතය හඳුන්වා දෙමින් ආචාර්ය තිස්ස අබේසේකර මෙසේ පවසයි "සිංහල සිනමාව විචිත්‍රවත් කල ෂෙලටන් ප්‍රේමරත්න ගී පෙළහර ".

එය ගෙජිතාභාසික දක්ෂකොන් පුවත කියවෙන දක්ෂකොන් චිත්‍රපටයේ ෂෙලටන් ප්‍රේමරත්න නිර්මාණය කළ, ගායක හෙකටර් ප්‍රනාන්දු ගැයූ ගීතයකි. මෙය ෂෙලටන් ප්‍රේමරත්න සංගීතවත්කල මුළුම සිංහල නූනත් ඔහු රසිකයින් අතරට පැමිණියේ මෙයින ය. මෙලෙස ජනාදරයට පත් චිත්‍රපට රාශියකට ඔහු සංගීතය සපයා ඇතත් විශේෂයෙන් සඳහන් කලයුතු චිත්‍රපට කීපයකම ඇත.

සංගීත පර්යේෂන චිත්‍රපටයක් ලෙස නිෂ්පාදනය කෙරුන "හිතක පිපුන මල්" ඉන් ප්‍රධාන තැනක ගනී. මයෙ ඇතුළත වූ ගීත රාශිය එකිනෙකට වෙනස් ගීත නිර්මානය කිරීමේ ෂෙලටන් මාස්ටර් තුල ඇති හැකියාව මොනවට විදහා පෑවිය. එම චිත්‍රපටයේ වූ ශාස්ත්‍රීය ගීතය සඳහා පන්ඩිත බිම්මෙන් ලේමි, උස්තාද් බරඩිගුලාම් අලිඛාන්, උස්තාද් අමීර්ඛාන්, හා පන්ඩිත ඩීවී පලුෂකාර් වැනි භාරතීය විභාරදායින් ගේ පවා හලල රැළිගැන්වීය හැකි ප්‍රතිභා සම්පන්න ගායනයක් කරමින් ෂෙලටන් මාස්ටර්ට සහය වූයේ විශාරද පී වී නන්දසිරිය. එය සරසවි උපහාර නර්තනයකට ෂෙලටන් නිර්මානය කල "කමලාසනී" ගීතයයි.

හිතක පිපුන මල් සඳහා සිය පෙරපර දෙදිග සංගීත ඥානය භාවිතා කරමින් නිර්මානය කල රුගුම් ගැයුම් වැයුම් ගීතය ගායනා කලේ විභාරද නන්දා මාලනීය. ගීතයේ ඉංග්‍රීසි ඔසින් රචනා කෙරුන කොටසට සුපුසිදධ වේගරේදම් ගායිකා ඩැලරීන් ආනොල්ඩා ගේ ගායන සහය නන්දාට ලැබින.

මෙම ගීතය අසන විට මතකයට නැගෙන තවත් මියුරු ගීතයක් ඇත. එය නම් අමරදේව, ගෙවිල් ප්‍රනාන්දු, මහගම සේකර යන විභාරදායින් ත්‍රිතාවය එකව රන්සලු චිත්‍රපටයට කල "ගීත නලු කලා පෙරපර යාගනෝ බෙඳී" යන ගීතයයි. මේ ගී දෙක සොයුරු ගී ලෙස සැලකිය හැකි තරමට අර්ථකයන් සමාන වුවත් ෂෙලටන් මාස්ටර් තැනූ ගීයේ විශේෂත්වයක් ඇත. එනම් සේකර ලියූ එම ගීය ගැයුනේ සිංහලෙන් පමනක් වුවත්, දවි භාෂිකව ලියැවුන ගීයට පෙරපර දෙදිග සංගීතය යොදා ගනිමින් ෂෙලටන් කල නිර්මාණය පියවරක් ඉදිරියට යාමක් වීමය.

"No east no west for artist – රැගුම් ගැයුම් වැයුම් තුලින උපන් කලා රසස්..රටක ඇයක් තැනක කියා වෙනස් කමක් නොපා, මිනිස් වගත මිනිස් කමත සමොසමයි කියා – ලොවේ ඉතා උදාරවූ පහන් හැඟුම් මවයි".

මෙම පනිවිඩය එදාවත් වඩා ගැලපෙන්නේ යුද්ධය ඉක්මනින් නිමකොට සියලු ජනකොටස් වලට සාමයෙන් විසිය හැකි රටක තනන්නට අවශ්‍යවී ඇති අදට නොවේද?

අප රටේ ආදිවාසීන් ගැන පර්යේෂන කරමින් ශ්‍රන්ථ රාශියක් ලියූ වෛදෙද සපිටල් මහතා (සුදු හුරා) වැදිභාෂවෙන් ලියූ ගීයක් සංගීතවත් කරමින් තැනූන "මාමිනි මාදෙයියා" යන ගීතය හිතක පිපුන මල් චිත්‍රපටය සඳහා ගායනා කලේ ෂෙලටන් මාස්ටර්ගේ ම සොයුරු විමල් ජේ ශ්‍රිකාරත්න ය. රැජ සංගීතය ඇමරිකාවෙන් ආනයනය කිරීමට දක්ෂ ගනනාවකට පෙර ෂෙලටන් මාස්ටර් මෙම ගීතයට රැජ සංගීත බන්ඩ ඇතුළත් කර ඇතිබව ගීතය ශ්‍රවනය කරනවිට වැටහේ. එමා අපේ දේශීය සංගීතයේ ඇති එක සවර සංගීතය යොදාගැනීමක්ය.

හෙළ සිනමා ගීතාවලියේ අනංගයා වන ජෝතිපාල ට ඔහු තනාදුන්නේ "ආශා දහසක් " යනුවෙන් ඇරඹෙන ගීතයයි. "අලිබබා මං අලිබබා " යන ගීතය පවිත්‍රත කරන විට සංගීත භාන්ඩ රාශියක් තමා වටකර ගත් බැවින් සබරකොලය මුලුමනින්ම තුරන්වූ බව "හිතක පිපුන මල්" චිත්‍රපටයේ ප්‍රචාරක ගුවන්විදුලි වැඩසටහනකට සහභාගීවුන බයිලා වතුවර්ති එම්. එස් ප්‍රනාන්දුය. සංගීත භාන්ඩ රාශියක් වායුනත් එය ඝෝෂාවක් නොව මිහිරි සංගීතයක් කිරීමට ඇති ෂෙලටන් ගේ හැකියාව ඉන් ප්‍රදර්ශනය කෙරුනි.
තමා විසින් සාදාගත් තනු පමනක් ගැයීමේ සුනිල් භාන්ත තුලවූ ප්‍රතිපත්තිය ෂෙලටන් මාස්ටර් ගේ ගුලිමේ අනුව වෙනස් කරන්නට කිඳුවිය. එහි ප්‍රතිඵලය නම් ගරු මසලින් ජයකොඩි පියතුමා ලියූ "My dreams of roses" යන ගීය ෂෙලටන් මාස්ටර් ගේ තනුවකට සුනිල් ශාන්ත ගැයීමය. එය ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂක G D L පෙරේරා ගේ "රොමියෝ ජුලියට් කථාවක් " චිත්‍රපටයට ඇතුළත්වූ ගීතයකි.

හෙළයේ මහා ගාන්ධර්වයා වන ආචාර්ය පන්ඩිත අමරදේව ද ෂෙලටන් මාස්ටර් ගේ තනුනිර්මාන වලට සහ සංගීත අධ්‍යක්ෂන වලට ගීගයු අවසරා කීපයකම විය. එයින් විශේෂයෙන් සඳහන් කලයුතු අවසරාවක් නම් ටී. බී. ඉලංගරත්න ගේ සවයං චරිතාපදානය චිත්‍රපටයට නැඟුන අවසරාවය. එය "තිලක භා තිලකා" චිත්‍රපටයි. අමරදේව වෙනුවෙන් නිර්මානය වුන ගීතය නම් තිලකට සිය නෑනන්ඩිය වන ලසදා අභිමිවීමේ විරහ වේදනාව නිරූපනය කල ගීතයයි.

සිංහල චිත්‍රපට ගීත ක්ෂෙත්‍රයේ ඉහලින් වැජඹුන තරු රාශියකට ෂෙලටන් මාස්ටර් ගීත නිර්මානය කලේය. ඔහු නිමැවූ "රන්තරු පුන්සඳ ගිලුනාදෝ " යන මියුරු ගීය හෙළ ගී කෝකිලා සුජාතා අත්තනායක් " සිහින තහක " චිත්‍රපටය සඳහා ගායනා කලාය. එකල ලංකාවේ චිත්‍රපට සංගීත අධ්‍යක්ෂනය ට සහය වීම සඳහා ලංකාවට පැමිනි T. R. පාපා නම් ඉන්දීය සංගීත වේදියා වේදියා ෂෙලටන් මාස්ටර් එම චිත්‍රපටයටම නිමැවූ "සුපුන් සඳක් නාශීලා කිරිබැබලෙන පාරුවේ " යන ගීතය රස වින්දේ විශ්මය ප්‍රාප්තවය. "ඉතින් තවත් අපෙන් උදුසු කුමටද ? " ඔහුට සිතෙනනට ඇත. ජෝති සහ ඇන්ජලින් මුල් වරට යුග ගීයක් ගැයුවේ ෂෙලටන් මාස්ටර් ගේ තනුවකටය. එය "ආලේ මිහිර පෙන්නා සියොතුන් නාද දෙන්නා"" යන ගීතයයි.

දුම්රියක ගමන නිරූපනය කෙරෙන "අහසේ තරු ගනිනන වෙයිද දන්නෙ නෑ – මුහුදේ වතුර බොන්න වෙයිද දන්නෙ නෑ" යන උපහාසාත්මක ගීය ෂෙලටන් මාස්ටර් නිර්මානය කලේ බහුත් එක්ක හොරු චිත්‍රපටයටය. ජෝ අබේවික්‍රමත් ගාමිණී ෆොන්සේකාත් වොලි නානායක්කාරත් ගමන කරන දුම්රියක් තුල ගීගයමින් සම්මාදම් යෙදෙන දර්ශනයක් මීට ඇතුළත්වය. ඔවුන් රඟපෑ, එම සමාජයෙන් කොන්වී ඇත වරිත, තමන් විසින්ම උපහාසයට ලක්කර ගැනීම ඉන්

ජයන්ත ඈපා

කැන්බරා

කදිමට නිරූපනය වුනි.

අනුකරනය (කොපි කිරීම) වරදක් වුවත් අනුවර්තනය එසේ නොවේ. එකල බෙහෙවින් ජනප්‍රිය වුන හිඳිදි චිත්‍රපටයක් වන දොස්ති අනවර්තනය වුනේ "කලන මිතුරෝ" නමිනි. එහි සංගීත අධ්‍යක්ෂනය කල ෂෙලටන් මාස්ටර් විසින් කරනලද සවතන්ත්‍ර තනු නිර්මාන මුලුමනින්ම දේශීය මුහුණුවරක් ඇතිව නිමවීම හෙළ මියැසිය යාගුතු මග පිළිබඳ ඔහුගේ ඇති අවබෝධයට තවත් සාධකයකි.

දොස්ති චිත්‍රපටයේ තෙමා ගීතය ලෙස ගනන් ගත හැකිමේ

"කොහිජබි රාහන පායේ – මෙරේ සඟ ආයේ""
"කිපෙහ පඟ දීපපලායේ – මෙරේ දොස්තී මෙරා පෑන්ර්"

යන මිත්‍රත්වයේත් ආදරයේත් අගය කියාපාන ගීතයයි.

මෙම ගීතය (සිංහලෙන්) රසිකසින් අතරට ගෙන ගිය යුත්තේ එකල යොවුන් ආදරයේ අරුත කියාදීමට දහස් ගනන් රෙයෙන රෙයෙනියන් රැඟුම්හලේ වෙත කැන්දූ විකටර් රත්නායක හැර අන් කවරෙක්ද ?

"කළුණ මිතුරු දහමයි – – පිරුනු සදාදරයයි"
"මාඳ රන්කුවේයේ – දිලෙන පහන් යුවළය""

මේ ඔහුගෙන් මුවින් ගිලිහුන වදනය.

තම කන්ඩායමේ සිටි දක්ෂ වයලීන වාදකයා ඔහු එලෙස සිතමාව කරා ගෙන ගියේය. තමන් හෙළ සිනමාවට හඳුන්වා දුන් සංගීත අධ්‍යක්ෂක වරුන් ගෙන් ප්‍රමුඛ කෙනෙකු ලෙස විකටර් ෂෙලටන් මාස්ටර් සිහිපත් කරන්නේ ඉමහත් ගෞරවයිනි.

චීනයට යන විදේශිකයකු එහි අසිරිය ගීතයකින් වර්නනා කරයි. මෙය "ලෝකෙන් ජනඹලයෙන් " යනුවෙන් ඇරඹෙන ගීතයෙන් කෙරෙන නිරූපනයයි. ගැයුම සඳහා තෝරා ගැනුනේ පුර වර්නනා ගී ගයා ඇති නිෂ්ශංක දිදොදනියයි. මෙය ශ්‍රවනය කරන විට චීන ගීතයක් ලෙස ඇසෙන්නේ චීන සංගීතයෙහි ආභාසය ලබා ඇති නිසාය. හෙළ බසෙහි ඇති නමස්ශිලි බව ප්‍රයෝජනයට ගනිමින් ලියාඇති ඇතැම් වචනද චීන වචන වලට හුරුය.

වාණිජ මෙන්ම සංඛ්‍යාත්‍ය චිත්‍රපට ගනනාවක සංගීත අධ්‍යක්ෂනය කල ෂෙලටන් මාස්ටර් තෙක හෙළ සිනමාවේ ප්‍රමුඛ අධ්‍යක්ෂක වරුන්වන ලෙස්ටර් ජේම්ස් පීරිස්, ධර්මසේන පතිරාජ, වසන්ත ඔබේසේකර වැනි අධ්‍යක්ෂ වරුන් නොපැමිනීම විමතියට කරුනක්. එහෙත් එම අඩුව පිරිමැසුනේ ෂෙලටන් මාස්ටර්ට හෙළ වේදිකා නාට්‍ය ක්ෂෙත්‍රයේ දැවැන්තයෙකු මුනගැසීමෙනි. ඔහු හෙනරි ජයසේනය. හෙන්රි කල ඇරයුම අනුව බර්ටෝල් බ්‍රෙෂ්ට් ගේ කෑතියක අසුරෙන ඔහු නිර්මානය කල "හුණුවටයේ කටාව"ට ලැබුන" ෂෙලටන් මාස්ටර් ගේ දායකත්වය බොහෝ දුරදිග ගියේය. එනම් ලෝකය පුරා විවිධ භාෂාවලින් නිෂ්පාදනය කෙරුන බර්ටෝල් බ්‍රෙෂ්ට් ගේ එම කථාව ඇතුළත් නාට්‍යෙන් අතුරෙන් හොඳම සංගීතය ඇත්තේ හුණුවටයේ කථාවෙහි බව රසිකයින් පිළිගැනීමය. එයට ගරුකිරීමක් ලෙස ෂෙලටන් මාස්ටර්ට ජර්මන් රජයෙන් පිරිනැමුනු ශිෂ්‍යත්වය හෙළ සංගීතය නව මගකට යොමුකරලය. එයනම් ෂෙලටන් මාස්ටර් ඉන් ලත් දැනුම උපකාරීකරගෙන මෙතෙක් භාවිතා නොකල බටහිර සංගීත භාන්ඩ රැසක හෙළ මියැසියට හඳුන්වාදීමය.

අන් හැම රසයන් පරයා අර්ථ රසය ඉස්මතුවන ගීතවලටද ෂෙලටන් මාස්ටර් ගේ සහය ලැබුන අවසරා බොහෝය. නන්දා මාලනී ගැයූ

"හිරුබිහිරියි සඳගොලුයි තාරකා අන්ධයි" සහ මාලනී මුලතිසිංහල ගැයූ "හිරු මඬලේ සිට තරුමඬ ලේ සිට දිවැස හෙළන පුතුන්" සහ ගුණදාස කපුගේ ගැයූ "කාඹර ගොයමට රහස් කියාලා" උදාහරන ලෙස දැක්විය හැකිය. අරගතහි ඇති චමත්කාරය නිරූපනය කිරීමට ඔහුගේ සහය ලැබුන අවස්ථා තව බොහෝ ඇතත් මෙබඳු කෙටි ලිපියකින් ඒ සියලුම විමසනු නොහැකිකි. එහෙත් "කාඹර ගොයමට" ගැන යමක් නොකියනු නොහැක. ඉතා වාදීන ජීවිතය දෙස බලන ගැමි තරුණයෙකුගේ ආදර පැතුමක් මින් නිරූපනය කෙරේ. තනුව පරිශ්‍රාවෙන් විමසුවිට එය පතල් කවිවල ආශ්‍රයෙය ලබා ඇතිබව පෙනේ.

ප්‍රවීන ශ්‍රී ලාංකික සංගීතඥයින් අතරින් ෂෙලටන් ප්‍රේමරත්න ගුරුගෙදරට පියනොනැගුන කෙනෙක් වෙතොත් එය පුදුමයක් යැයි විභාරද නන්දා මාලනී වරක පවසා ඇත. ෂෙලටන් ප්‍රේමරත්න ශ්‍රීලංකාවේ හොඳම සංගීත ගුරුවරයා ගෙන් කෙනෙකු බව පිලිගැනීමට තවත් සාධක කුමටද ?

ඔහුගේ ගොලයින් මෙරට, අප අතරද සිටී. කැන්බරා නුවර නාදරු සංගීත කන්ඩායමේ නායක ජනක බානගල, සම්මාන ලාභී වෙලෝ වාදක ප්‍රවීන සංගීතාචාර්ය විභාරද රංජිත මධුරප්පෙරුම, සිඩ්නි නුවර ප්‍රවීන සංගීතාචාර්ය විභාරද රුක්මලී කුලතිලක, ප්‍රවීන වයලීන වාදක රවි කුලතිලක, ප්‍රවීන වයලීන වාදක හිරාන් කුලතිලක (කුලතිලක සොයුරු සොයුරියන්) නම් වශයෙන් මා දන්නා අයයි. ෂෙලටන් මාස්ටර් වැනි ගුරුවරයකු ගේ ගොලයින්වගෙන් නන් අයුරින් සහය ලබා ගන්නට සමත් අපිදු භාග්‍ය වන්තයෝ නොවෙමුද ?

මේ අයගේ මුලිකත්වයෙන් ෆජි සහ අනෙක ප්‍රාන්ත වල සංගීත ශිල්පීන් සහ සංගීත ශෝලීන්ගේ සහය ඇතිව, කලාශූරී ෂෙලටන් ප්‍රේමරත්නයන්ගේ සහ ඔහු අපට දායාද කල පුත් රුවන වන සංගීතඥ අග්‍රා ප්‍රේමරත්න ගේ සහභාගීත්වය ඇතුව, ෂෙලටන් නිර්මාන ඇතුළත් රැගුම් ගැයුම් වැයුම් උලෙළක්, කිසිදු ලාභඥභාග්‍යෂා වකින් තොරව කැන්බරා නුවර පන්වන්නට යන බව අසන්නට ලැබීම සතුටට කරුනකි. හෙළ සැබියාව ගැන මනා අවබෝධයක් ඇති පරිනත සංගීත ශෝලියකු වන ශ්‍රී ලංකා මහකොමසාරිස අතිගරු කුසුමපාල බාලපෙබැඳි මහතා ඇතුළු කාර්ය මන්ඩල රේ පුරාණ සහගෝගය මීට ලැබෙන බව ද තවත් ඉහ ආරංචියකි.

ඔසට්ලියානු ප්‍රාන්ත අශරකයෙහිම ෂෙලටන් ප්‍රේමරත්න ඇදුරුතුමන් ගේ ගොලයින් තවත් රාශියක් වෙසනු ඇතැයි මම විශ්වාස කරමි. ඒ අය ගේ නම් නොදැන සිටීම ගැන සමාව අයදිමින් ඉතාම හැඟීම් බරව ඔවුනගෙන් ඉල්ලා සිටින්නේ මෙබඳු ප්‍රසංගයක් පැවැත්වීමකින් හෝ වෙනයම් අයුරකින් මෙතුමන්ට උපහාර දක්වන ලෙසය.

මීට අඩසියවසකට පෙර සුනිල් ශාන්ත සහ ආනන්ද සමරගෝන් විසින් දමනලද අඩිතාලම මත ඉදිකෙරුන හෙළ මියැසිය, අද අඟස සුරන මැදුරක්. දැඩි වේග රිද්ම සලින් පවා දෙදරුම් නොකෑ, එහි, මහල ගනනාවකම ඉදිකලේ කලාශූරී ෂෙලටන් ප්‍රේමරත්න බව අභිතව පවසමින් මෙම ලිපිය නිමකිරීමට අවසර පතමි.

IN AID OF THE BUILDING FUND OF SAKYAMUNI SAMBUDDHA VIHARA - BERWICK

සත්සර මියුරු ගී සමගින් වසන්ත රංගන

SATURDAY 16TH FEBRUARY 2008

TWO SHOWS: 2:30PM & 6:30PM
Rowville Secondary College Theatre
(Melway Ref: 82 E1)

Designed by : Lakshan

එකම වේදිකාවේ ගී ගායනී

Tickets: Special $30 - Adults $20 - Children 12 & under - $10
Contact: Ajith 97022670 - Kamal 95485428 - Gamini 93953199
or any Sri Lankan store